# විකල්ප බලශක්ති මූලාශ්‍ර සඳහා වැඩි අවධානයක්

*පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී*
*ටී. ඒ. ධම්මරත්න විසිනි*

ශ්‍රී ලංකාවේ බලශක්ති ප්‍රමාණයෙන් 70%ක් දරවලින් ලබා ගන්නා අතර 10%ක් ජල විදුලි බලය මගින් ද, ඉතිරි 20% ක ප්‍රමාණය ආනයනය කරන ලද ඛණිජ තෙල් මගින් ද සපුරා ගනී. විදුලි බලය හා ඛණිජ තෙල් ප්‍රධාන වාණිජ බලශක්තීන් වන අතර පරිභෝජනයට ගැණෙන ආකාරය අනුව මෙයින් 54% ක් පරිවහන කටයුතු සඳහා ද, 26% ක් කර්මාන්තශාලා සහ වාණිජ ආයතනද තවත් 17% ක් ගෘහස්ථ පරිභෝජනයට ද ඉතිරි 3% ක ප්‍රමාණය අනෙකුත් කටයුතු සඳහා ද වැය කර ගනී. මෙම ගණනය කිරීම සඳහා, කෘෂිකාර්මික හා ධීවර නිෂ්පාදනයන් වියලා ගැනීමටත් මුහුදු ජලයෙන් නිපදවන ලුණු වේලා ගැනීමටත් භාවිතා කරන සූර්ය බලශක්තිය අයත් නොවන අතර, සී සෑමට, ප්‍රවාහන කටයුතු වලට සහ අනෙකුත් සතුන්ගෙන් ලබා ගන්නා ශ්‍රම බල ශක්තියද, අයත් නොවේ. කෙසේ වුව ද, ජාතික බලශක්ති සැපයුමෙන් 70% ක ප්‍රමාණයක් දැව හා දර වලින් සපයන නිසා ශ්‍රී ලංකාවේ ජන ගහනයෙන් 94% ක් පමණ වූ ආහාර පිසීමට අවශ්‍ය බලශක්තිය එමගින් ලබා ගන්නා නිසාත්, එය ලංකාවේ ප්‍රධානතම බලශක්ති මාධ්‍යය හැටියට සැළකිය හැකිය.

ශ්‍රී ලංකාවේ බලශක්ති මූලාශ්‍ර ලෙසට දැව සහ දර ලබා ගැනීමේ ප්‍රධාන මාර්ග තුනක් ඇත. මේ අනුව, දර සැපයුමෙන් 28% ක් පොල් ගසේ අපද්‍රව්‍යවලින් ද, එය පොල්පිති, අතු, හනසු හා ලෙලි ආදියෙන් ද 18% ක් රබර් නැවත වගා කිරීමේදී ඉවත් කරන රබර් ගස් වලින් ද අතික් 53% ගෙවතු ආශ්‍රිත හා වනාන්තරවලින් ලැබෙන දැව සහ දර වර්ගවලින් ද සපුරා ගනී. මේ අනුව සෑම වර්ෂයකදීම දළ වශයෙන් දර ටොන් 85,00,000 ක් ගෘහස්ථ ආහාර පිසීම සඳහා වැය කරන අතර, තවත් දර ටොන් 15,00,000 ක් පමණ නොයෙකුත් කාර්මික කටයුතු සඳහා අපි වැය කරන්නෙමු. මෙම කාර්මික කටයුතු අතර තේ, රබර්, පොල්, බේකරි, ගඩොල් හා උළු පෝරණු ආදිය ඇතුළත් වන අතර සාමාන්‍යයෙන් එක වර්ෂයක දී දර ටොන් කෝටියක් පමණ පුළුස්සා දමන බව වාර්තා වේ. එමෙන්ම නිෂ්පාදනය කරන සෑම තේ කිලෝවක් සඳහාම සාමාන්‍ය වශයෙන් දර කිලෝ ග්‍රෑම් දෙකක් පමණ පුළුස්සා දැමීමට සිදුවේ. එහෙත් මෙම අවශ්‍යතාවයට සරිලන ප්‍රමාණයට ලංකාවේ දැව හා දර අවුරුදු පතා නිෂ්පාදනය නොවන හෙයින් අනිවාර්යයෙන්ම අනාගත බලශක්ති අර්බුදයක පෙර නිමිත්තක් ලෙසට එය පෙන්වා දිය හැකිය.

කලකට පෙර මෙරට තිබූ වන සම්පත් මගින් නම් මෙම අවශ්‍යතාවයන් ඉටු කර ගත හැකි වුවත්, දැනට රටේ ඇති වනාන්තර පෙදෙස් ශීඝ්‍රයෙන් අඩුවී යාමේ හේතුවෙන් මේ ප්‍රශ්ණය තව තවත් උග්‍ර කරනු ඇත. මේ ආකාරයට දර නිෂ්පාදනය අඩු වෙමින් පවතින අතර, දර සඳහා ඇති

ඉල්ලුම නැතහොත් අවශ්‍යතාවයන් ශීඝ්‍රයෙන් දිනපතාම වැඩි වෙයි. මෙවන් පසුබිමක දර හිඟයක් ඇති වුවහොත් දැනට ඉතිරිව ඇති සීමිත වන සම්පතද විනාශ වී යාම නැවැත්විය නොහැකි අතර එය ස්වාභාවික විපත් ඇති වීමේ මාර්ගයක් වනු නිසැකය. 1956 දී 44% ක්ව තිබූ වන බිම් ප්‍රමාණය 1984 දී 22% දක්වා අඩුවී තිබුණි. දැනට පවතින පරිහරණ වේගය අනුව එය වර්ෂ 2010 දී අපේ වන සම්පත 3% දක්වා අඩු කිරීමට ඉඩකඩ සලසනු ඇත. කෙසේ වෙතත් ජනගහනය වැඩිවීම, කෘෂිකර්මය සඳහා නව බිම් හෙළි පෙහෙළි කිරීම, ජනාවාස ඉදි කිරීම, හේන් ගොවිතැන් සහ දැව ලබා ගැනීම ආදී කරුණු හේතු කොට ගෙන වනාන්තර කැපීම ශීඝ්‍රයෙන් සිදු වීම නිසා ඉදිරි කාලයේ දී අපට අවශ්‍ය තරම් දැව හා දර ලබා ගැනීම නිසැසකයෙන් ම අසීරු කරුණක් වන හෙයින් විකල්ප බලශක්ති මූලාශ්‍ර කෙරෙහි අපේ අවධානය යොමු විය යුතුය.

ලංකාවේ ඛණිජ තෙල් පරිභෝජනය සළකා බලන විට අවශ්‍යතා අනුව විවිධ කොටස් වලට වෙන් කළ හැකිව තිබේ. ගමනා ගමන අංශවල අවශ්‍යතා හා මගීන් ප්‍රවාහනය සඳහා; භාණ්ඩ ප්‍රවාහණය සඳහා; කර්මාන්තශාලාවල යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා; කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර සඳහා; නිතිපතා ඛණිජ තෙල් පරිහරණය කළ යුතුව ඇත. මීට අමතරව ගෘහස්ථ පරිභෝජනය වශයෙන් ආලෝකය සපයා ගැනීමටත්, ආහාර සකසා ගැනීමටත්, ඛණිජ තෙල් භාවිතා කරති. එසේ වූවද ශ්‍රී ලංකාවේ ඛණිජ තෙල් පරිභෝජනය නොයෙකුත් සීමාවන් තුළ පවත්වා ගෙන යන බලශක්ති මාධ්‍යයකි. මෙම සීමාවන් අංශ කීපයකින් අපට සාකච්ඡා කළ හැකිය. ඛණිජ තෙල් සම්පත් මෙතෙක් ශ්‍රී ලංකාවට අහිමි සම්පතකි. එය ශ්‍රී ලංකාවේ භූමි කළාපය තුළ මෙතෙක් සොයාගෙන නැති අතර, දැනට පරිභෝජනය කරන ඛණිජ තෙල් ප්‍රමාණය මුළුමණින්ම ආනයනය කර ගනී. මේ සඳහා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ශ්‍රී ලංකාව වැය කරයි. මේ අනුව බොර තෙල් ආනයනය සඳහා වාර්ෂිකව වැය කරන විශාල විදේශ විනිමය ප්‍රමාණය ලංකාව වැනි දියුණුවන රටක ආර්ථිකය කෙරෙහි කොතරම් බලපාන්නේද යන්න පහත සඳහන් සංඛ්‍යා සටහන පෙන්නුම් කරයි.

1972 වර්ෂයේ දී එක්සත් ජනපද ඩොලර් 2 කට මිළට ගත හැකිව තිබුණු බොර තෙල් බැරලයක අද මිළ එක්සත් ජනපද ඩොලර් 30 කටත් වඩා අධිකය. මේ අතර රටේ ආර්ථික සංවර්ධන කටයුතු හා අනෙකුත් අවශ්‍යතා සඳහා අවශ්‍ය ඛණිජ තෙල්

| වර්ෂය | | ඛණිජ තෙල් ආනයනය සඳහා යන වියදම ශ්‍රී ලංකාවේ මුළු ආනයන ආදයමේ ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|
| 1970 | ... | 4 |
| 1982 | ... | 47 |
| 1985 | ... | 18 |
| 1989 | ... | 12 |

ඉල්ලුම සපුරා ලීමට වැඩි වැඩියෙන් ඛණිජ තෙල් ආනයනය කිරීමට සිදුවේ. එහෙත් ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට එය ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව ඉතා සීමිතය. මේ නිසා විකල්ප බලශක්ති මාධ්‍යයන් හඳුන්වා දීම හා මේවායේ අගයන් වටහා ගැනීම බලශක්ති සංරක්ෂිත ප්‍රතිපත්ති අනුගමනය කිරීමත් ඉතා ඵලදායී ක්‍රියාවලියක් වී ඇත. "විදුලි බලය" බලශක්ති මාධ්‍යයක් ලෙසට ශ්‍රී ලංකාවේ ප්‍රධාන තැනක පසුවෙයි. පසුගිය දශක දෙක තුනක කාලය තුළ එහි වර්ධනය ඉතා ශීඝ්‍රයෙන් සිදුවූ අතර වාර්ෂික වර්ධනය දළ වශයෙන් 7%ක් පමණ විය. 1970 ගණන්වල ඇති වූ ඛණිජ තෙල් මිළ ඉහළ යාම හේතු කොට ගෙන විදුලි බලය සඳහා වූ ඉල්ලුම කිහිප ගුණයකින් වැඩිවිය.

ශ්‍රී ලංකාවේ විදුලි බලය වැඩි වශයෙන්ම සැපයෙන්නේ ජලාශ ආශ්‍රිතව ජල විදුලි බලාගාරවලිනි. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ ජල සම්පත් ආශ්‍රිත විදුලි බලය නිපදවීමට විශාල මුදලක් වැය නොවුනත් මෙම ආශ්‍රිත ජලාශ ඉදි කිරීමටත් මෙම විදුලි බලය විවිධ ප්‍රදේශ පුරා බෙද හැරීමටත් විශාල මුදලක් වැය වෙයි. තව ද, ආර්ථික සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙසටත්, වැඩිවන ජනගහනය නිසා ඇතිවන ගෘහස්ථ අධි ඉල්ලුම සපුරා ලීමටත් නව විදුලි බලාගාර හා මේ ආශ්‍රිත පාදක ව්‍යුහයට විශාල මුදලක් වැය වේ. එය හේතු කොට ගෙන විදුලි බලය සඳහා සාමාන්‍ය පාරිභෝගිකයන් ගෙවන මිළ ද වැඩිවී ඇත.

මෙම බලශක්ති මධ්‍යස්ථාන පිළිබඳ ගැටළුව ශ්‍රී ලංකාවට විශේෂ වූවක් නොව එය සංවර්ධනය වෙමින් පවතින රටවල් විශාල සංඛ්‍යාවකට පොදු වූවකි. ඊට අමතරව අද බලශක්ති පිළිබඳ ගැටළුව සංවර්ධනය වෙමින් පවතින රටවලට පමණක් නොව සංවර්ධනය වූ රටවලටද එකසේ බලපා ඇත. මේ නිසා විකල්ප බලශක්ති මාධ්‍යයන් පිළිබඳව, විශේෂයෙන්ම සංවර්ධනය වූ රටවල්, දැන් වැඩි අවධානයක් යොමු කර ඇති අතර, මේ පිළිබඳ විවිධ අත්හද බැලීම් පර්යේෂණ හා සංවර්ධන කටයුතු කරනු ලබයි. ස්වභාවික ප්‍රභා සංස්ලේෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් බිහි වන ශාක ඉන්ධන විකල්ප බලශක්ති මාධ්‍යයක් ලෙසට භාවිතා කිරීමට ඇති හැකියාව කෙරේ ලොව පුරා සිටින විද්‍යාඥයින්ගේ අවධානය දැන් යොමුවී ඇත. එංගලන්තයේ කිංස් කොලේජ්හි ආචාර්ය ඩේවිඩ් හෙවිල් මහතා ප්‍රකාශ කරන අන්දමට පෘථිවි තලයේ ශාක ද්‍රව්‍යවල ගබඩා වී ඇති බලශක්ති ප්‍රමාණය ස්ථිර වශයෙන් දැනට නොපෙනෙන අතර, පොසිල ඉන්ධන (පෙට්‍රෝලියම්) ප්‍රමාණයට දළ වශයෙන් සමාන නිසා ඉතා කෙටි කාලයක් තුළදී අනිවාර්යයෙන්ම මිනිසාට ශාක ඉන්ධන කරා යොමු වීමට සිදු වන බවය. එසේ හෙයින් පෙට්‍රෝලියම් යුගය අවසානයේ දී මිනිසාට ඉන්ධන සහ පොහොර ලබා දෙන ප්‍රධාන මූලාශ්‍රය ලෙසට ශාක හා එම ද්‍රව්‍ය වැදගත් වේ. මේ නිසා එසේ සංවර්ධනය වූ රටවල් ජීව අපද්‍රව්‍ය ව්‍යාපෘතීන් පිළිබඳ දැඩි සැළකිල්ලක් දක්වා ඇති අතර, මේ පිළිබඳ ජාත්‍යන්තර සහයෝගිත්ත්වය ලබා ගැනීමට කටයුතු කරගෙන යයි. මේ අනුව බෙල්ජියම, කැනඩාව අයර්ලන්තය, ස්වීඩනය, එක්සත් ජනපදය වැනි රටවල් ජීව ද්‍රව්‍ය භාවිතයේ දී සහයෝගිත්ත්වයෙන් කටයුතු කිරීමට දැනටමත් එකඟ වී ඇති අතර, එම එකඟත්ත්වය මත ස්වකීය නව සොයා ගැනීම් සෙසු හවුල් කරුවන් අතර බෙද හැරීමත්, ජාතික ජීව ද්‍රව්‍ය වැඩසටහන් සංවර්ධනය කිරීමටත් එකඟ වී ඇත. මේ නිසා යුරෝපයේ බොහෝ රටවල "වනාන්තර පිළිබඳ පොදු ප්‍රතිපත්තිය" කෙරෙහි එකඟත්ත්වයකින් යුතුව කටයුතු කිරීමට දැන් ගිවිස ගෙන ඇත.

ඉවත දමන ලද කැළිකසළ මගින් බලශක්තිය නිපදවීම විකල්ප බලශක්ති මාධ්‍යයන් අතර, ප්‍රමුඛ ස්ථානයක් ගනී. බ්‍රිතාන්‍යයේ කසළ සෝධකයන්ගේ වැඩවර්ජනයක් හේතු කොට ගෙන කැළිකසළ වලින් බලශක්තිය ජනනය කරගත හැකි බව මුලින්ම අනාවරණය විය. ඒ අනුව බ්‍රිතාන්‍යයේ අපද්‍රව්‍ය පාලනය පිළිබඳ උපදේශක මණ්ඩලය, කැළිකසල ඉන්ධන වශයෙන් ප්‍රයෝජනයට ගතහැකි බව පෙන්වා දෙයි. බ්‍රිතාන්‍යයේ විශාල නගරවල එකතු වන ටොන් දශලක්ෂ සංඛ්‍යාත කැළිකසල ප්‍රමාණය ඉන්ධන සඳහා යොද ගත හැකි බව පෙන්වා දෙන මොවුන් එසේ කළහොත්, 1976 මිළ ගණන් අනුව ගල් අඟුරු ටොන් දශලක්ෂ 2–8 ප්‍රමාණයක් බ්‍රිතාන්‍යයට ඉතිරි කරගත හැකි බව පෙන්වා දී ඇත.

මෑතදී සිට ශ්‍රී ලංකාවේ ද විකල්ප බලශක්ති මාධ්‍යයන් භාවිතය කෙරෙහි දැඩි අවධානය යොමු කර ඇත. ජීව වායුව හා සූර්ය බලය මගින් විදුලිය නිපදවා ගැනීම මෙහිලා වැදගත් ප්‍රධාන විකල්ප බලශක්ති

මාධ්‍යයන් දෙකක් වී ඇත. ජීව වායුව, ශක්තිය හා සූර්ය බලශක්තිය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු තවමත් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික තත්ත්වයක පවතින අතර මේ පිළිබඳ නිසි අවධානයක් තවමත් යොමු කර නැත. මේ නිසා ජීව වායු ශක්තිය පිළිබඳ සෑහෙන සංවර්ධනයක් ලබා සිටින රටවල් සමග සහයෝගයෙන් කටයුතු කිරීමෙන් මෙම ක්ෂේත්‍රයේ එම රටවල් ලබා ඇති ප්‍රතිඵල අධ්‍යයනය කිරීම අපට වාසිදායක වනු ඇත. මේ සම්බන්ධයෙන් මැඩගස්කරය, බංග්ලා දේශය, ඝානාව හා ඉන්දියාව වැනි නිවර්තන කළාපීය රටවල් ලබා ඇති ප්‍රගතිය මෙහි ලා ඉතාමත් ප්‍රයෝජනවත් වනු ඇත.

"විකල්ප බලශක්ති මාධ්‍යයක්" පිළිබඳව මෑත කාලීනව දක්නට ඇති ප්‍රධාන උපනතිය නම් මේ අංශයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු මුළුමණින්ම වාගේ පුද්ගලික අංශයේ ව්‍යාපාරික කළමණාකාරිත්ත්වයට යොමු වී ඇති බවයි. පුද්ගලික අංශයේ ආයතන මෙම විකල්ප බලශක්ති මාධ්‍යයන්ගේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු කෙරේ යොමුවීම විවිධ දෘෂ්ටී ක්ෂේත්‍රයන් ඔස්සේ විමසුමට භාජනය කළ හැකිය. එසේ වුවත් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින හා අඩු ආදයම් ලබන රටක මෙවැනි පර්යේෂණ හා සංවර්ධන කටයුතු කිරීම විශාල වියදම් සහිත ක්‍රියාවලියක් බැවින් මේ පිළිබඳව පුද්ගලික අංශයේ ක්‍රියාකාරිත්ත්වය හා දයකත්ත්වය අගය කළයුතු වෙයි. කෙසේ නමුත් දැනට ශ්‍රී ලංකාවේ පුද්ගලික අංශයේ ආයතනත්, රාජ්‍ය නොවන සංවිධානත් ඇතැම් රාජ්‍ය සංවිධානත් මේ පිළිබඳව දැඩි අවධානයෙන් කටයුතු කරන අතර ඇතැම් ආයතන මේ කටයුතු වාණිජ මට්ටමකින් පවත්වා ගෙන යාමට උනන්දුවන බවක් ද පෙනෙන්නට ඇත. මෙම කටයුතු කරගෙනයාමේ දී දැනට දක්නට ලැබෙන ප්‍රධාන බාධකයක් නම් මේ සඳහා යොදා ගත යුතු උපකරණවල අධික නිෂ්පාදන වියදමයි. උදා : සූර්ය බලශක්තිය ලබා ගැනීමට යොදා ගත යුතු උපකරණ මිළට ගැනීමට ඉතා අධික ධනයක් වැය කළ යුතු වේ. මේ නිසා අඩු වියදම් සහිත උපකරණ නිෂ්පාදනය කර ගැනීම මෙහිලා ඉතා වැදගත් වන සාධකයක් වී ඇත.

ඉවත දමන කැලි කසළ මගින් ජීව වායුව නිපදවා ගැනීමට ඇති ඉඩකඩ ශ්‍රී ලංකාවේ ඉතා විශාලය. විශේෂයෙන් ගොවිපල වලින් අපතේ යන ද්‍රව්‍යයන් මේ සඳහා උපයෝගී කර ගත හැකි අතර, එමගින් මීතේන් වායුව නිපදවා බලශක්තිය ලබා ගත හැකිය.

ඉන්දියාවේ බැරෝඩාහි කෘෂිකර්ම විද්‍යාලයක් මගින් සත්ත්ව හා කෘෂි අපද්‍රව්‍ය මගින් මීතේන් වායුව නිපදවීම පිළිබඳ පර්යේෂණ රැසක් කර ඇත. මෙම පර්යේෂණ වලට අනුව කුට්ටි වලට කපන ලද කෙසෙල් කඳන් නිර්වායු තත්ත්වයක් යටතේ ජීර්ණය කිරීමෙන් මීතෙන් වායුව 67% ක්, කාබන්ඩයොක්සයිඩ් වායුව 32% ක් හා වෙනත් වායු වර්ග 1% කුත් ලබා ගත හැකි බව ස්ථිර වශයෙන් ප්‍රකාශ කර ඇත. දින 27 ක කාලයක් තුළදී මෙම ද්‍රව්‍ය ජීර්ණය වීමෙන් මෙම වායුව ජනනය වන අතර කෙසෙල් කඳන් කි. ග්‍රෑම් 1 කින් නිපදවිය හැකි මීතෙන් වායු ප්‍රමාණය ඊ හා සමාන ගොම ප්‍රමාණයකින් නිපදවිය හැකි ගෑස් ප්‍රමාණයට සමාන් වේ. මේ ආකාරයට සළකා බලන විට, ලංකාවේ ජීව වායුව මගින් බල ශක්තිය ලබා ගැනීමට ඇති හැකියාව හා ඉඩකඩ ඉමහත් ය. එසේම එය වාණිජ මට්ටමින් පවත්වා ගෙනයාමට ඇති හැකියාවද බොහෝය.

මෙයට අමතරව ශ්‍රී ලංකාවේ විශාල වශයෙන් ඉවත ලන අපද්‍රව්‍යයක් වශයෙන් උක් රොඩු මගින් බලශක්ති නිපදවීමට ඇති හැකියාවද සැළකිල්ලට භාජනය විය යුතු කරුණකි. "ජීව ස්කන්ධ" හෙවත් මෙම අපතේ යන උක් රොඩු මගින් බලශක්තිය ජනනය කර ගන්නා රටවල් කිහිපයකි. උදා : හවායි දිවයිනේ විශාල බලශක්ති ප්‍රමාණයන් ලබාගන්නේ මේ මගිනි. එබැවින් උක් රොඩු මගින් බලශක්තිය ලබා ගැනීමට කටයුතු කිරීම ශ්‍රී ලංකාවේ අනාගත බලශක්ති අවශ්‍යතා සපුරා ගැනීමට කදිම පිළියමක් වනු ඇත.

කෙසේ නමුත් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල මෙම විකල්ප බලශක්ති මූලාශ්‍රයන් දියුණු කිරීමට ඇති බාධක ගැටළු බොහෝය. යුනිඩෝ සංවිධානය විසින් කර ඇති අධ්‍යයන වාර්තාවකට අනුව මෙම ජීව වායුව වැනි විකල්ප බලශක්ති මූලාශ්‍රයන්ගේ සංවර්ධනයට බාධා ඇති කරන කරුණු කීපයක් මෙසේ කෙටිකර දැක්විය හැකිය :

1. විකල්ප බලශක්ති මූලාශ්‍රයන් සහ ඒවා උපයෝගී කර ගැනීම පිළිබඳ නිශ්චිත වැඩ පිළිවෙලවල් ග්‍රාමීය ප්‍රදේශ වලට හඳුන්වා නොදීම;
2. මෙකී බලශක්ති මූලාශ්‍රයන් පිළිබඳ සංවර්ධන සැළැස්මක් සකස් කිරීමට හා ඒවා ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධානයන්ට නොහැකි වී තිබීම;
3. සම්ප්‍රදයි නොවන බලශක්ති මූලාශ්‍ර උපයෝගී කර ගැනීමට හා සංවර්ධනයට යෝග්‍ය දේශීය තාක්ෂණයන් දුර්වල මට්ටමක පැවතීම;
4. මෙම අංශයේ සංවර්ධනය උදෙසා අවශ්‍ය ඉංජිනේරු විද්‍යා සංවර්ධන හා උපකරණ නිපදවීමේ හැකියාව ඇති දේශීය තාක්ෂණයක් නොතිබීම;
5. යෝග්‍ය ආයතනික හා පාදක ව්‍යුහමය පහසුකම් නොමැති වීම.

එහෙයින් මෙම අංශයේ සංවර්ධනය උදෙසා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කර ඇත. :

(i) ජීව වායුව, සූර්ය බලශක්තිය වැනි විකල්ප බලශක්ති මාධ්‍යයන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම;
(ii) විකල්ප බලශක්ති මාධ්‍යයන්ගෙන් ලබා ගත හැකි සේවය හා එහි කාර්ය භාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම;
(iii) මෙකී බලශක්ති මූලාශ්‍රයන් දියුණු කිරීම සඳහා අවශ්‍ය පාදක ව්‍යුහමය පහසුකම් වැඩි දියුණු කිරීම.

## අළුත් වී වර්ගයක්

කරදිය සහිත කුඹුරු බිම්වලට ඔරොත්තු දෙන ආකාරයේ වී වර්ගයක් නිපදවීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කලක සිට උත්සාහ දරණ ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් තව නොබෝ කලකින් එහි සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකි බවට ඔවුන් ප්‍රතිඥා දෙයි. ක්ෂේත්‍රයට යොදා අත්හදා බලා ඉන්පසු එම වී වර්ගය ළඟදී ම ගොවීන්ට නිකුත් කිරීමට අදහස් කරගෙන සිටියි.

මෙම පුවත කරදිය මගින් කුඹුරු හානියට පත්වන දහස් ගණන් ගොවීන්ගේ අමන්දානන්දයට හේතු වන්නක් බව කීම අවශ්‍ය නොවේ. විනාශ මුඛයට ගිය කුඹුරු බිමෙන් සරු අස්වැන්නක් දැක ගැනීමේ "සිහිනය" මතු දිනක සැබෑ වන බවට එක්තරා ඉඟියක් මෙය. විශේෂයෙන් මාතර ප්‍රදේශයේ කරදියට යටවන කුඹුරු යායවල් හිමි අය මෙයින් ඉතාමත් සතුටු වනු ඇතැයි යනු අපේ හැඟීමයි. (තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවැති රැස්වීමක දී කරන ලද කථාවක් ඇසුරෙනි.)

සංස්කාරකගෙන්.